# STATEMENT OF CASH FLOWS

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of Sri Jayewardenepura***

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

## මුදල්

අතැති මුදල් හා ඉල්ලුම් තැම්පතු

**උදා :-**

1. මුදල් ශේෂය
2. සුළු මුදල් ශේෂය

## මුදල් හා සමාන දෑ

කිසිදු අවදානමකින් තොර ව මුදල් බවට පරිවර්තනය කළ හැකි ඉතා ඉහළ ද්‍රවශීලීතාවෙන් යුත් කෙටි කාලීන ආයෝජන වේ.

**උදා :-**

භාණ්ඩාගාර බිල්පත් (මාස 03)

ClassWork.LK

## මුදල් ප්‍රවාහයන්

මුදල් හා මුදල් හා සමාන දෑ ආයතනය තුළට ගලා ඒම ලැබීම් ප්‍රවාහයක් ලෙස ද ගලා යෑම ගෙවීම් ප්‍රවාහයක් ලෙස ද හැඳින්වේ.

## මෙහෙයුම් ක්‍රියාකාරකම්

ව්‍යාපාර ආයතනයක ප්‍රධාන ආදායම් ඉපදවීමේ ක්‍රියාමාර්ග තුළින් ඇති වන මුදල් ප්‍රවාහයන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වේ. නැතහොත් ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම් නොවන අනෙකුත් ක්‍රියාකාරකම් වේ.

**උදා :-**

(1) භාණ්ඩ හෝ සේවා අලෙවියෙන් ලැබෙන මුදල්

(2) භාණ්ඩ හෝ සේවා සැපයීම වෙනුවෙන් සැපයුම්කරුවන්ට ගෙවන මුදල්

(3) සේවකයන්ට ගෙවන වැටුප් හා වෙනත් ගෙවීම්

(4) රක්ෂණ ගෙවීම් හෝ ප්‍රතිලාභ ලැබීම්

(5) මූල්‍ය හා ආයෝජන ක්‍රියාකාරකම් යටතේ විශේෂයෙන් හඳුනා ගත නොහැකි ඕනෑ ම මුදල් ප්‍රවාහයක්

ClassWork.LK

## ආයෝජන ක්‍රියාකාරකම්

අනාගත ආදායම් උත්පාදනය කිරීමේ අපේක්ෂාවෙන්, වර්තමානයේ දී සම්පත් වෙනුවෙන් කෙරෙන ආයෝජන ක්‍රියාකාරකම් මෙයින් අදහස් වේ.

අනාගත ව්‍යාපාර අභිවෘද්ධිය සඳහා දිගුකාලීන වත්කම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීමේ සහ ඉවත් කිරීම්වලට අදාළ ක්‍රියාකාරකම් මේවාට අයත් වේ.

**උදා :-**

(1) දේපළ පිරියත හා උපකරණ, අස්පෘශ්‍ය වත්කම් හා අනෙකුත් දිගුකාලීන වත්කම් අත්පත් කර ගැනීමට, ඉදි කිරීමට හෝ සංවර්ධනය කිරීමට ප්‍රාග්ධනගත කළ පිරිවැය

(2) දේපළ පිරියත හා උපකරණ, අස්පෘශ්‍ය වත්කම් හා අනෙකුත් දිගුකාලීන වත්කම් විකිණීමෙන් ලැබෙන මුදල්

Classwork.LK

(3) වෙනත් ව්‍යාපාරවල ස්කන්ධය හෝ ණය ප්‍රාග්ධනය තුළ කර ඇති ආයෝජන හා බද්ධ ව්‍යාපාරවල හිමිකම් ආයෝජනයට ගෙවන මුදල් හෝ එකී ආයෝජන විකිණීමෙන් ලැබෙන මුදල්.

(4) බාහිර හා අභ්‍යන්තර පාර්ශ්වයන්ට දෙනු ලැබූ ණය හෝ මුදල් අත්තිකාරම් ගෙවීම් හා ණය ආපසු ලැබීම්. (පොලී ලැබීම්, ලාභාංශ ලැබීම්, ගොඩනැගිලි කුලී ලැබීම් ආදිය)

ClassWork.LK

## මූල්‍ය ක්‍රියාකාරකම්

ව්‍යාපාරයක ස්පෘශ්‍ය වත්කම් සහ ණය ප්‍රාග්ධනයේ ප්‍රමාණයේ හෝ සංයුතියේ වෙනස්කම් ඇති කෙරෙන ක්‍රියාකාරකම් වේ.

මේවා ව්‍යාපාරයක අරමුදල් සම්පාදන මාර්ග හා බැඳුණු මුදල් ප්‍රවාහයන් වේ.

**උදා :-**

(1) කොටස් හෝ වෙනත් එවැනි ස්කන්ධ උපකරණ නිකුතුවකින් ලැබෙන මුදල්

(2) කොටස් අත්පත් කර ගැනීමට හෝ නිදහස් කිරීමට ගෙවන මුදල්

(3) ණයකර හෝ වෙනත් දිගු කාලීන ණය ගැනීම්වලින් ලද මුදල් හෝ එවැනි ණය ආපසු ගෙවීම්

(4) කල්බදු වාරික ගෙවීම් (පොලී හැර)

(5) කොටස් හිමියන්ට ලාභාංශ ගෙවීම් / අයිතිකරුවන් වෙත කරන බෙදාහැරීම්

ClassWork.LK

# මුදල් ප්‍රවාහ වාර්තා කිරීම

ව්‍යාපාරයක ගිණුම් කාලච්ඡේදයකට අදාළ මුදල් ප්‍රවාහයන් වාර්තා කිරීම ප්‍රධාන ක්‍රම දෙකකට සිදු වේ.

(1) සෘජු ක්‍රමය
(2) වක්‍ර ක්‍රමය

මෙම ක්‍රම දෙකට ම ගණනය කළ හැකි වන්නේ ව්‍යාපාරයක මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහ පමණි. ආයෝජන සහ මූල්‍ය ක්‍රියාකාරකම් ගණනය කළ හැකි වන්නේ සෘජු ක්‍රමයට පමණි.

ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් සකස් කර ඇත්තේ සෘජු ක්‍රමයට ද වක්‍ර ක්‍රමයට ද යන්න තීරණය වන්නේ මෙහෙයුම් ක්‍රියාකාරකම් ගණනය කිරීමේ දී අනුගමනය කරන ලද ක්‍රමය පදනම් කර ගැනීමෙනි.

# සෘජු ක්‍රමය හා වක්‍ර ක්‍රමය

සෘජු ක්‍රමයේ දී ආයතනයක දළ මුදල් ලැබීම් හා දළ මුදල් ගෙවීම් සියල්ල අනාවරණය කරයි.

නමුත් වක්‍ර ක්‍රමයේ දී වර්ෂයේ ලාභයට හෝ ශුද්ධ ආදායමට මුදල් නොවන ගනුදෙනු කාරක ප්‍රාග්ධන අයිතමයන්ගේ වෙනස්වීම් සහ වෙනත් ක්‍රියාකාරකම්වලට අයත් එහෙත් ලාභය තුළ අඩංගු අයිතම වෙනුවෙන් ගැළපීම් කර මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය ගණනය කරයි.

මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය සෘජු ක්‍රමයට වාර්තා කිරීමේ දී, ශුද්ධ ලාභය ගණනය කිරීමට යොදා ගන්නා ආදායම් හා වියදම් අයිතමයන්ගෙන් ජනනය වූ මුදල් ප්‍රවාහයන් අදාළ කර ගනියි.

වක්‍ර ක්‍රමයට මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේ දී කාලච්ඡේදයේ බදු පෙර ශුද්ධ ලාභය ගෙන එහි මුදල්මය නොවන අයිතමයන් ඉවත් කරනු ලැබේ.

ClassWork.Lk

| සෘජු ක්‍රමය | වක්‍ර ක්‍රමය |
| --- | --- |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළ ඇති ප්‍රධාන ගනුදෙනුවලින් ලද හා ගෙවූ මුදල් වාර්තා කිරීම සිදු කරයි.<br><br>__උදා :__<br><br>• අත්පිට ගැනුම් / විකුණුම්<br><br>• ණයහිමි ගෙවීම් / ණයගැති ලැබීම්<br><br>• ලද කොමිස් / පොලී හා වෙනත් ලැබීම්<br><br>• මුදලින් කළ මෙහෙයුම් වියදම් | කාලච්ඡේදයේ බදු පෙර ශුද්ධ ලාභය / අලාභය පදනම ලෙස ගෙන එයට පහත ගැළපීම් සිදු කරයි.<br><br>__**මූල්‍යමය නොවන ස්වභාවයේ අයිතමයන්**__<br><br>__උදා :__<br><br>• ක්ෂය, වත්කම් විකුණුම් අලාභ, පොලී වියදම එකතු කළ යුතුයි.<br><br>• වෙනත් ක්‍රියාකාරකම් යටතට ගැනෙන දැනට ලාභය තුළ අන්තර්ගත ආදායම් අඩු කළ යුතුයි.<br><br>__උදා :__ පොලී, ලද ලාභාංශ |

ClassWork.LK

| | |
|---|---|
| • බදු ගෙවීම්<br><br>• පොලී ගෙවීම් | • උපචිතයන් හා ඉදිරියට කළ ගෙවීම් සහිත කාරක ප්‍රාග්ධන සංචලනයන් ගැළපීම.<br>**උදා :** ගෙවූ ආදායම් බදු, ගෙවූ ණය පොලී |

තව ද වෙනත් ක්‍රියාකාරකම් තුළ හඳුනා ගත යුතු දැනට ලාභයේ අඩංගු අයිතම සහ කාරක ප්‍රාග්ධනයේ සංචලනයන් ගළපන අතර එලෙස ලැබෙන මෙහෙයුම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයට මුදලින් ගෙවූ ආදායම් බදු, ණය පොලී අඩු කර මෙහෙයුම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කරනු ලැබේ.

මෙම ගණනය කිරීම් පහත සටහන මගින් තවදුරටත් පැහැදිලි කළ හැකි ය.

ClassWork.LK

## ............................ ව්‍යාපාරය
## ......................................... දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සෘජු ක්‍රමයට

(රු.)

| | | |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්** | | |
| අත්පිට විකුණුම් | | xxx |
| වෙළෙඳ ලැබිය යුතු දෑ මත ලද මුදල් | | xx |
| අත්පිට ගැනුම් | | (xx) |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ සඳහා ගෙවූ මුදල් | | (xx) |
| මුදලින් ගෙවූ පරිපාලන වියදම් | | (xx) |
| මුදලින් ගෙවූ බෙදාහැරීමේ වියදම් | | (XX) |
| අනෙකුත් මුදලින් ගෙවූ මෙහෙයුම් වියදම් | | (x) |
| මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ / යෙදවූ මුදල් | | XX |
| ගෙවූ පොලී | | (x) |
| ගෙවූ බදු | | (xx) |
| මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ / යෙවූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | XX |
| **ආයෝජන ක්‍රියාකාරකම්** | | |
| දේපළ පිරියත හා උපකරණ විකිණීමෙන් ලද මුදල් | xxx | |
| අනෙකුත් ජංගම නොවන වත්කම් විකිණීමෙන් ලද මුදල් | xx | |
| සේවක ණය දීම් | x | |
| ලැබූ ලාභාංශ | x | |
| ලැබූ පොලී | x | |
| ලැබූ පොලී | x | |
| දේපළ පිරියත උපකරණ මිලට ගැනීම | (X) | |
| අනෙකුත් ජංගම නොවන වත්කම් මිලට ගැනීම | (x) | |
| ආයෝජන කටයුතුවලින් ජනනය වූ / යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | xx |
| **මූල්‍ය ක්‍රියාකාරකම්** | | |
| කොටස් නිකුත් කිරීම | xx | |
| බැංකු ණය ගැනීම | xx | |
| වෙනත් දිගුකාලීන ණය ගැනීම් | xx | |
| ලාභාංශ ගෙවීම් | (xx) | |
| අයිතිකරුවන් වෙත කරන බෙදාහැරීම් | (x) | |
| ණය ආපසු ගෙවීම් | (x) | |
| ණය වාරික ගෙවීම් | (x) | |
| මූල්‍ය කල් බදු වාරික ගෙවීම් (පොලී හැර) | | |
| මූල්‍ය කටයුතුවලින් ජනනය වූ / යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | xx |
| ශුද්ධ මුදල් ජනනය වීම් / යෙදවීම් | | xx |
| ආරම්භක මුදල් හා මුදල් සමාන දෑ | | xx |
| අවසාන මුදල් හා මුදල් සමාන දෑ | | xx |

ClassWork.LK

# වක්‍ර ක්‍රමයට මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ / යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහයන් සෙවීම

| | | |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් | | |
| බදු පෙර ලාභය | | xxx |
| + දේපළ පිරියත හා උපකරණ ක්ෂය වීම | | xx |
| + දේපළ පිරියත හා උපකරණ ඉවත් කිරීමේ අලාභ | | xx |
| - දේපළ පිරියත හා උපරණ ඉවත් කිරීමේ ලාභ | | (xx) |
| + පොලී වියදම | | x |
| - ලැබූ පොලී, කුලී හා ලාභාංශ | | (xx) |
| කාරක ප්‍රාග්ධන සචලනයට පෙර මෙහෙයුම් ලාභය | | xx |
| **කාරක ප්‍රාග්ධන සංචලනයන්** | | |
| තොග වෙනස් වීම (ආරම්භක හා අවසාන ශේෂ වෙනස) | | x |
| වෙළෙඳ ලැබිය යුතු දෑවල වෙනස් වීම (ආරම්භක හා අවසාන ශේෂ වෙනස) | | x |
| ඉදිරියට ගෙවූ වියදම් (ආරම්භක හා අවසාන ශේෂ වෙනස) | | x |
| වෙළෙඳ ගෙවිය යුතු දෑවල වෙනස් වීම (ආරම්භක හා අවසාන ශේෂ වෙනස) | | x |
| උපචිත වියදම් (ආරම්භක හා අවසාන ශේෂ වෙනස) | | x |
| මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ / යෙදවූ මුදල් | | xx |
| - ගෙවූ පොලී | | (x) |
| - ගෙවූ බදු | | (xx) |
| මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ / යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | xx |

ClassWork.LK

## අභ්‍යාසය - 01

(1) පහත සඳහන් අයිතමයන් LKAS 07 ප්‍රමිතියට අනුව අදාළ පරිදි හඳුනා ගන්න. අදාළ අයිතමය ඉදිරියෙන් මුදල් හා මුදල් සමාන අයිතමයක් ද යන්න වාර්තා කරන්න.

| | |
|---|---|
| සුළු මුදල් ශේෂය | ....................................... |
| මුදල් ශේෂය (වාසිදායක) | ....................................... |
| වසර 02ක ආයෝජන | ....................................... |
| භාණ්ඩාගාර බිල්පත්‍ර (මාස 03ට අඩු) | ....................................... |
| ස්ථාවර තැන්පතු (වර්ෂයක) | ...................................... |

ClassWork.LK

(2) ශ්‍රී ලංකාවේ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 (LKAS 07) ට අනුව සෘජු ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් පිළියෙල කිරීමේ දී පහත සඳහන් අයිතම වර්ගීකරණය කළ යුතු වන්නේ කුමන ක්‍රියාකාරකමේ ද යන්න දැක්වීමට අදාළ තීරුවේ (√) ලකුණ යොදන්න.

| අයිතමය | මෙහෙයුම් | ආයෝජන | මූල්‍ය |
|---|---|---|---|
| වෙළෙඳ ලැබිය යුතු දෑවලින් ලැබෙන මුදල් හා චෙක්පත් | | | |
| සේවක මණ්ඩලයට ගෙවූ වැටුප් හා වේතන | | | |
| ආදායම් බදු ගෙවීම් | | | |
| ලාභාංශ ගෙවීම | | | |
| ව්‍යාපාර ගොඩනැගිල්ල සඳහා කුලී ලැබීම | | | |
| කල්බදු ක්‍රමයට ගත් දේපළ සඳහා | | | |
| ගෙවූ වාරිකය (පොලී හැර) | | | |
| රඳවාගත් ඉපයුම් ප්‍රාග්ධනිත කිරීම | | | |
| ව්‍යාපාරයේ ප්‍රයෝජනයට යන්ත්‍රයක් මිලට ගැනීම | | | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑවලට ගෙවූ චෙක්පත් | | | |
| පැරණි කාර්යාල උපකරණ විකිණීමෙන් ලද මුදල | | | |
| ණය පොලී ගෙවීම | | | |
| හිමිකම් කොටස් නිකුතුවෙන් ලද මුදල් | | | |
| බැංකු ණය ගැනීම් | | | |
| විගණන ගාස්තු ගෙවීම | | | |
| ස්ථාවර තැන්පතු පොලිය ලැබීම | | | |
| බැංකු ණය ආපසු ගෙවීම් | | | |
| දේපළ පිරියත හ උපකරණ මිල දී ගැනීම් | | | |
| පෞද්ගලික විදුලිය හා රක්ෂණ ගෙවීම් | | | |
| දිගු කාලීන ආයෝජන අත්පත් කර ගැනීම් | | | |
| අත්පිට විකුණුම් | | | |
| අත්පිට ගැනුම් | | | |

ClassWork.LK

## අභ්‍යාසය - 02

සීමිත ජනුලි පොදු සමාගමේ 2017. 03. 31 දිනෙන් අවසන් වසර සඳහා සමාගම පිළියෙල කරන ලද මුදල් (බැංකු) පාලන ගිණුම පහත දැක්වේ.

**සීමිත ජනුලි පොදු සමාගම**

**2017.03.31 න් අවසන් වසර සඳහා**

**මුදල් පාලන ගිණුම**

| රු, 000 | | රු, 000 | |
|---|---|---|---|
| 2016.04.01 ඉ/ගෙ/ ශේෂය | 1 500 | අත්පිට ගැනුම් | 2 000 |
| අත්පිට විකුණුම් | 4 000 | වෙළෙඳ ණයහිමියන්ට ගෙවීම් | 3 500 |
| වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබීම් | 7 500 | | |
| | | **වියදම්** | |
| **ආදායම්** | | පරිපාලන වියදම් | 2 000 |
| ආයෝජන සඳහා ලාභාංශ ලැබීම් | 400 | බෙදාහැරීමේ වියදම් | 1 200 |
| ගොඩනැගිලි කුලී ලැබීම් | 200 | ණය පොලී ගෙවීම් | 1 000 |
| **වෙනත් ලැබීම්** | | **වෙනත් ගෙවීම්** | |
| ඉඩම් විකිණීමෙන් ලද මුදල | 5 500 | ආදායම් බදු ගෙවීම | 2 000 |
| සාමාන්‍ය කොටස් නිකුතුවෙන් ලැබීම් | 3 000 | මෝටර් රථයක් මිලට ගැනීම | 4 500 |
| බැංකු ණය ගැනීම් | 2 000 | ලී බඩු හා කාර්යාල උපකරණ | 1 500 |
| හිමිකම් කොටස් නිකුතුවෙන් ලැබීම් | 1 000 | | |
| | | ගැනුම් | |
| | | ණය ආපසු ගෙවීම | 1 000 |
| | | කල් බදු වාරිකය | 2 800 |
| | | ගෙවීම | |
| | | ගෙවූ ලාභාංශ | 2 400 |
| | | 2017.03.31 ප/ගෙ/ ශේෂය | 1 200 |
| | 25 100 | | 25 100 |

ClassWork.LK

**සටහන් :**

ගෙවූ කල්බදු වාරිකය තුළ රු. 500ක කල්බදු ණය පොලී ද ඇතුළත්ව ඇත.

**අවශ්‍යවන්නේ :**

(1) සීමිත ජනුලි පොදු සමාගමේ 2017.03.31 න් අවසන් වසර සඳහා මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ මුදල සෘජු ක්‍රමයට දැක්වෙන ආකාරයට LKAS 07 ප්‍රමිතයට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් පිළියෙල කිරීම

ClassWork.LK

# <u>අභ්‍යාසය - 03</u>

(1) සීමිත මෙත්ලිනි පොදු සමාගමේ පහත තොරතුරු උපයෝගී කර ගෙන බදු පෙර ලාභය ගණනය කරන්න.

| | රු |
|---|---|
| 2016.04.01 දිනට රඳවා ගත් ඉපයුම් ගිණුමේ ශේෂය | 4 000 |
| **2017. 03. 31න් අවසන් වසර තුළ සිදු වූ ගනුදෙනු සමහරක් පහත දැක්වේ.** | |
| සාමාන්‍ය කොටස් හිමියන්ට ගෙවූ ලාභාංශ | 500 |
| සාමාන්‍ය කොටස් හිමියන්ට යෝජිත ලාභාංශ | 400 |
| හිමිකම් කොටස් නිකුතුවෙන් ලද මුදල් | 2 000 |
| රඳවාගත් ඉපයුම් ප්‍රාග්ධනිත කිරීම | 1 000 |
| පොදු සංචිතයට මාරු කිරීම් | 1 500 |
| වසර තුළ මුදලින් ගෙවූ බදු | 1 200 |
| වසරට අදාළ බදු වියදම | 1 600 |
| 2017.03.31 දිනට රඳවා ගත් ඉපයුම් ගිණුමේ ශේෂය | 5400 |

ClassWork.LK

(2) LKAS 07 ට අනුව මෙහෙයුම් කටයුතුවල මුදල් සාමාන්‍ය ගණනය කිරීමේ දී (වක්‍ර ක්‍රමය) සීමිත පොදු සමාගමක බදු පෙර ලාභය දී ඇති විටක පහත සඳහන් අයිතම සම්බන්ධයෙන් කළ යුතු ගැළපීම් අදාළ පරිදි සටහන් කරන්න.

| අයිතමය | කළ යුතු ගැළපීම | | |
|---|---|---|---|
| | එකතු කළ යුතුයි | අඩු කළ යුතුය | ගැළපීම අවශ්‍ය නැත |
| දේපළ පිරියත උපකරණ මත ක්ෂය වීම් | | | |
| ලැබූ ලාභාංශ ආදායම | | | |
| පරිපාලන කටයුතුවලට භාවිත කළ මෝටර් රථය විකිණීමෙන් ලද ලාභය | | | |
| පොලී වියදම | | | |
| ණයගැතියන්ගෙන් ලද මුදල | | | |
| මුදලින් ගෙවූ බදු | | | |
| වසරට අදාළ බදු වියදම | | | |
| මුදලින් ගෙවූ පොලිය | | | |

Class Work.LK

(3) සීමිත සංකල්ප සමාගමේ 2017.03.31 දිනට හා 2016.03.31 දිනට ජංගම වත්කම් හා වගකීම් පහත දැක්වේ. ප්‍රමිතයට අනුව මෙහෙයුම් කටයුතුවල මුදල් ප්‍රවාහය ගණනය කිරීමේ දී ඒවායේ වෙනස්වීම් එකතු කරන්නේ නම් (+) ලෙස ද අඩු කරන්නේ නම් (-) ලෙස ද දක්වන්න.

| අයිතමය | 2016.03.31 | 2017.03.31 | කළ යුතු ගැළපීම |
|---|---|---|---|
| අග තොගය | 2 000 | 2 500 | |
| ඉදිරියට ගෙවූ වියදම් | 500 | 300 | |
| වෙළඳ ණය ගැතියෝ | 3 500 | 3 000 | |
| වෙළෙඳ ණයහිමියෝ | 1 200 | 1 700 | |
| උපචිත මෙහෙයුම් වියදම් | 700 | 300 | |

ClassWork.LK

## අභ්‍යාසය - 04

(1) සීමිත වෙහාන් සමාගම 2016.04.01 දින මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද අතර, එහි පළමු වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පහත දී ඇත.

**සීමිත වෙහාන් සමාගම**

**2017.03.31 දිනෙන් අවසන් වසර සඳහා**

**ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය**

රු. 000

| | | |
|---|---|---|
| විකුණුම් | | 9 500 |
| විකුණුම් පිරිවැය | | (4 500) |
| දළ ලාභය | | 5 000 |
| වෙනත් ආදායම් | | 500 |
| | | 5 500 |
| පරිපාලන වියදම් | 1 400 | |
| බෙදාහැරීමේ වියදම් | 1 600 | |
| මූල්‍ය වියදම් | 400 | (3 400) |
| බදු පෙර ලාභය | | 2 100 |
| වර්ෂයේ ආදායම් බදු | | (600) |
| කාලච්ඡේදයේ ලාභය | | 1 500 |

ClassWork.LK

## සීමිත වෙහාන් සමාගම

## 2017.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | රු. 000 |
|---|---:|
| දේපළ පිරියත හා උපකරණ | 7 000 |
| ආයෝජන (සීමිත ශාන්ති සමාගම) | 2 000 |
| තොගය | 1 500 |
| වෙළෙඳ හා ලැබිය යුතු දෑ | 4 000 |
| බැංකුවේ ඇති මුදල් | 1 000 |
| මුළු වත්කම් | 15 500 |
| **හිමිකම් හා වගකීම්** | |
| ප්‍රකාශිත ස.කො. ප්‍රාග්ධනය (රු. 90 කොටස් 100) | 9 000 |
| රඳවා ගත් ඉපයුම් | 1 000 |
| 10% බැංකු ණය (2016.04.01) | 3 000 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 2 250 |
| ගෙවිය යුතු පොලී | 150 |
| ගෙවිය යුතු බදු | 100 |
| | 15 500 |

ClassWork.LK

**අතිරේක තොරතුරු :**

(1) සීමිත වෙහාන් සමාගම සියලු ගැනුම් හා විකුණුම් ණය පදනම මත සිදු කර ඇත. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන වෙළෙඳ ලැබිය යුතු දෑ වෙළෙඳ ණයගැතියන් වන අතර වෙළෙඳ ගෙවිය යුතු දෑ වෙළෙඳ ණය හිමියන් වේ.

(2) ආදායම් ප්‍රකාශනයේ දැක්වෙන මූල්‍ය වියදම්වලින් රු. 100 000 ක් බැංකු ගාස්තු වන අතර ඉතිරිය බැංකු ණය සඳහා පොලිය වේ.

(3) දේපළ පිරියත උපකරණ සංයුතිය පහත දැක්වේ.

| වත්කම | පිරිවැය | සමුච්චිත ධාරණ අගය | ක්ෂය |
|---|---|---|---|
| යන්ත්‍ර හා උපකරණ | 2 400 | 400 | 2 000 |
| මෝටර් රථ | 3 000 | 600 | 2 400 |
| ඉඩම් | 2 600 | - | 2 600 |
| | 8 000 | 1 000 | 7 000 |

සියලු දේපළ පිරියත උපකරණ අත්පිට මුදලට මිලට ගෙන ඇත.

ClassWork.LK

(4) වෙනත් ආදායම් ලෙස දක්වන්නේ ආයෝජන සඳහා ලද ලාභාංශ වේ.

(5) සමාගම වසර තුළ දී ලාභාංශ ගෙවා ඇත.

**අවශ්‍යවන්නේ :**

i) LKAS-7 ට අනුව (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය)

- මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ /යෙදවූ මුදල සෘජු ක්‍රමයට දැක්වෙන පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීම

- මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ / යෙදවූ මුදල වක්‍ර ක්‍රමයට දැක්වෙන පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීම

ii) මුදල් ප්‍රවාහයක් ලෙස හඳුනා ගත නොහැකි අයිතම දෙකක් දක්වන්න.

ClassWork LK

## අභ්‍යාසය - 05

සීමිත හේරත් පොදු සමාගම

**2017.03.31 දිනෙන් අවසන් වසර සඳහා**

**ලාභ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය**

**Rs. 000**

| | සටහන් | වටිනාකම | වටිනාකම |
|---|---|---|---|
| විකුණුම් | | | 20 000 |
| විකුණුම් පිරිවැය | | | (8 000) |
| දළ ලාභය | | | 12 000 |
| වෙනත් ආදායම් | | | 400 |
| | | | 12 400 |
| බෙදාහැරීමේ වියදම් | | 2 300 | |
| පරිපාලන වියදම් | | 2 700 | |
| මූල්‍ය වියදම් | | 1 000 | |
| වෙනත් වියදම් | | 400 | (6 400) |
| බදු පෙර ලාභය | | | 6 000 |
| ආදායම් බදු වියදම | | | (1 500) |
| කාලච්ඡේදයේ ලාභය | | | 4 500 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | |
| ඉඩම් ප්‍රත්‍යාගණන අතිරික්තය | | | 2 500 |
| මුළු විස්තීර්ණ ආදායම | | | 7 000 |

ClassWork.LK

# සීමිත හේරත් පොදු සමාගම

## 2017.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | සටහන් | වටිනාකම 2017.03.31 | වටිනාකම 2016.03.31 |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත උපකරණ | | 18 000 | 15 300 |
| ආයෝජන | | 2 000 | 1 000 |
| **ජංගම වත්කම්** | | | |
| අග තොගය | | 2 200 | 1 000 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | | 2 500 | 1 500 |
| භාණ්ඩාගාර බිල්පත් (ත්‍රෛමාසික) | | 500 | - |
| මුදල් | | 1 700 | 200 |
| මුළු වත්කම් | | 26 900 | 19 000 |
| **හිමිකම් හා වගකීම්** | | | |
| **ප්‍රකාශිත ප්‍රාග්ධනය** | | | |
| සාමාන්‍ය කොටස් | | 13 000 | 8 000 |
| සංචිත | | | |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 4 000 | 1 500 |
| පොදු සංචිතය | | 2 500 | 2 000 |
| රඳවා ගත් ලාභය | | 5 200 | 4 200 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| බැංකු ණය | | 1 700 | 2 600 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 500 | 700 |
| **මුළු හිමිකම් හා වගකීම්** | | **26 900** | **19 000** |

ClassWork.LK

**අතිරේක තොරතුරු :**

(1) මූල්‍ය වියදම් ලෙස දැක්වෙන්නේ වසර තුළ ගෙවන ලද පොලිය වේ.

(2) සමාගම සියලු ගැනුම් හා විකුණුම් ණය පදනම මත කරනු ලැබේ.

(3) වසර තුළ රු. 1 000 000/-ක් පිරිවැය සහිත උපකරණ විකිණීමෙන් රු. 400 000ක ලාභයක් උපයා ගෙන ඇත.

(4) 2017.03.31 දිනට තොගය පිරිවැය අනුව රු. 2 600ක් වූ අතර ශුද්ධ උපලබ්ධි අගය අනුව රු. 2200/-කි. වෙනත් වියදම් යටතේ දැක්වෙන්නේ තොග කපා හැරීම් රු. 400/වේ.

ClassWork.LK

# සීමිත හේරත් පොදු සමාගම

## දේපළ පිරියත හා උපකරණ

| පිරිවැය | ඉඩම් | ගොඩනැ-ගිලි | මෝටර් රථ | උපකරණ | මුළු එකතුව |
|---|---|---|---|---|---|
| 2016.04.01 ඉ/ගෙ/ ශේෂය | 4 500 | 5 800 | 1 200 | 5 700 | 17 200 |
| මිලට ගැනීම් | - | - | 2 000 | - | 2 000 |
| ඉවත් කිරීම් | - | - | - | (1 000) | (1 000) |
| ප්‍රත්‍යාගණන ලාභ | 2 500 | - | - | - | 2 500 |
| 2017.03.31 ප/ගෙ/ශේෂය | 7 000 | 5 800 | 3 200 | 4 700 | 20 700 |
| සමුච්චිත ක්ෂය : 2016.04.01 ඉ/ගෙ/ ශේ | - | 800 | 300 | 800 | 1 900 |
| වසරට අදාළ ක්ෂයවීම් | - | 400 | 500 | 300 | 1 200 |
| ඉවත් කිරීමේ ක්ෂය | | - | - | (400) | (400) |
| 2017.07.31 ප/ගෙ/ ශේෂය | - | (1 200) | (800) | (700) | (2 700) |
| 217.03.31 දිනට ධාරණ අගය | 7 000 | 4 600 | 2 400 | 4 000 | 18 000 |

ClassWork.LK

**අවශ්‍යවන්නේ :**

**සීමිත හේරත් පොදු සමාගමේ ඉහත දැක්වෙන මූල්‍ය ප්‍රකාශනයන් හා අතිරේක තොරතුරු සැලකිල්ලට ගනිමින්,**

1) LKAS-07 අනුව සෘජු ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීම

2) LKAS-07 අනුව මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ / යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහයේ වක්‍ර ක්‍රමයට දැක්වෙන පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීම

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය

ආර්ථික විද්‍යාව

ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura